
# කිරි කඳුලෙන් දිවි රැකගන්නා මනම්පිටි ජනතාව



විල්ලුවලට දක්කනතුරු ය. ශාලක

කිරි කළ දෙකක් කරේ තබා ගත් කෙසඟ හැඩියෙක් හෙමින් හෙමින් කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයට පා නැඟුවා. කිරි කළ බිම තැබූ ඔහු මෙතක් කැසකවා ගෙන තිබූ සරම පහත දැම්මා. මම හැතැප්ම හතරක් ම මේ විදිහට ආවා. කිරි දීලා ආයේ ම ඔය දුර යන්න ඕන. උදේ හතරට නැගිටලා කිරි දෙවා ගෙනයි මේ එන්නේ. මේ විදිහට කරෙන්, කදෙන්, බයිසිකල් වලින් කිරි භාජන මධ්‍යාස්ථානයට ළඟා උනා.

මහත්තයාලා සෝමසූරියම් පෝඩියාර් ගේ පට්ටියට ගියොත් හොඳයි. මනම්පිටියේ කිරි කතාව එයාලා විස්තර කරයි. තවත් ගැමියෙක් අපට ළං වුනා. පොළොන්නරුව-මඩකලපුවේ පාරේ හැතැප්ම අටක් දුර ගියාමයි මනම්පිටිය පිහිටලා තියෙන්නේ. දිඹුලාගල පන්සලට යන පාරත් මනම්පිටිය හරහායි අපි ගුරු පාර දිගේ සෝමසූරියම් පොඩියාර් ගේ කිරි පට්ටිය බලා ගියා. අවුරුදු දහ අටක තරම් ගැටයෙක් කිරි දෙවිනවා. එයා පොඩියාර් ගේ බාල පුතෙක්. තාත්තා කුඹුරට ගිහින්. මම තමයි කිරි පට්ටියේ වැඩ කරන්නේ.

අපිට හරක් 250 ක් විතර ඉන්නවා. කිරි එළදෙනුන් තිහක්. දවසකට ලීටර විසිපහක් විතර දෙවිනවා. කිරි දෙවත් මෙයාලත් අනික් හරක් එක්ක කැලේට අරිනවා. ආයේ හැන්දෑවට ගාලට දක්කන් එනවා. තණ කොළත් දැන් නැති තරම්. විල්ලු ඉඩම් හිටන් මිනිස්සු එළි කරලා වගාවට අරන්. කුඹුරු වලටත් හරක් යනවා. එතකොට කුඹුරු කාරයෝ හරක්ට කොටනවා. ඊයේත් මුදියන්සේ ගේ එළදෙන්නු දෙන්නෙක්ට තුවාල යි. කරත්තයකින් උන්ව ගෙදර ගෙනාවේ. ඒ මිනිස්සු කියන්නේ වැට වල් ගහන්න කම්බි ගන්න සල්ලි නැහැ. අපිට හරක් කවන්න තැනක් නැහැ.

පාක්‍යරාජා තවත් එළදෙනක් ගහක බැන්ද. මේකි හරිම හොරයි. කිරි ගන්න දෙන්නේ ම නැහැ. පස්ස කකුල් දෙකත් කඹයකින් බැන්ද. පැටියාටත් කිරි දෙන්නේ නැහැ. ඔය එළදෙනට ලෙඩක්. කිරි බුරුල්ල ඉදිමිලා. සතාට බෙහෙත් දෙන්න දොස්තර කෙනෙකුට පෙන්නුවේ නැද්ද අපේ තිලේනාදන් ඇහුවා. මෙහේ ඒවා කරන්න අමාරුයි. පොළොන්නරුවේ යන්න ඕනි. සතුන්ව ගෙනියන්නත් බැහැ නේ. අපි මේ ටිකත් කරන්නේ බොහෝම කරදරෙන්. මේ ගාලේ ඉන්න සේරම හරක්ගෙන් වැඩක් නැහැ නේ. හොඳ කිරි හරක් තියා ගෙන අනික් උන් විකුණන්න පුළුවන් නේද? මහත්තයා මෙහේ එහෙම බැහැ. අපි මෙහෙමවත් කිරි හරක් ගෙන් කිරි ගන්නවා. මෙහේ සමහරු ඉන්නවා, කිරි ගන්නේත් නැහැ. පට්ටියේ හරක් සිය ගණනක්. ලොකු පට්ටියක් ඉන්න එක සමාජ තත්වය ඉහළ දමන්නක් බවට ඇහවීමක්. කිරි නොදෙව්වත් එයාලට සතා හරි වටිනවා. අපිට ගොම ට්‍රැක්ටරයක් රුපියල් එකසිය පණහකට විතර විකුණා ගන්න පුළුවන්. යාපනේ ලොරිකාරයෝ මෙහේ එනවා ගොම ගෙනියන්න. යාපනේට ගොම දෙන්නේ ඒවා ඔයාලගේ කුඹුරුවලට දමන්න පුළුවන් නේද? මහත්තයා එක සැරේ හම්බ වෙන සල්ලිය නේ ගොම වලින්.


පාක්‍යරාජාගේ පැටව් ගාල ඌරු කොටුවකට අන්තයි. අඩි හයයි හතර තරමේ මඩුවක පැටව් තිස් දෙනෙක්. රෑට ලගින්නවත් ඉඩක් නැහැ. පොළොන්නරුවේ ආණ්ඩුවේ ගොවිපලේ මෙ

තරම් මඩුවක පැටව් හතර දෙනෙකුට වැඩිය නැහැ නේද? එහේ වැඩ අපිට කරන්න බැහැ නේ එහේ දවසකට දෙසැරයක් කිරි දෙවීනවා. හොඳට සතුන් බලාගත්තොත් ඔයාලටත් එහෙම ආදයම් ගන්න පුළුවන් නේ. හැමෝම කියනවා ඔය හරක් වර්ග කරන් අළුත් ක්‍රමවලට හදන්න කියලා. ඕවා එහෙන් මෙහෙන් අහලා තියනවා විතරයි. අපිට හරියට කියලා දෙන්න කෙනෙක් නැහැ. අපිට සල්ලින් නැහැ ඒ තරම්. කිරි මණ්ඩලයේ මේ එකතු කිරීමේ මධ්‍යස්ථානය දැම්මයින් පස්සෙයි අපිට මෙහෙමවත් ආදයමක් ලැබෙන්නේ. දැන් මෙහෙන් කිරි ලීටර් 1,500 ක් විතර එකතු වෙනවා මණ්ඩලේට පාක්‍යරාජා කිව්වා.

පාක්‍යරාජා කිරි බොනවා ද? අනේ මම නම් කිරි බොන්නේ නැහැ. උදේට හවසට ලක්ස්ප්‍රේ බොනවා. අප්පා විතරයි කිරි බොන්නේ. අනික් අයත් ලක්ස්ප්‍රේ. පවුලේ අට දෙනෙක් අයියයි ඉස්සර හරක් බැලුවේ. එයාට රස්සාවක් ලැබුණා. ඊට පස්සෙයි මම මේක පටන් ගත්තේ. ඉස්කෝලේ හයට විතරයි ගියේ. ඔන්න අප්පා ඇවිත්. එයා කෑ ගහයි හරක් තවම මෙතැන ද කියල. දැන් කැලේට අරින වේලාව. කිරි ටික දීලා එන්නත් එපායැ. පාක්‍යාරාජා ගාලට ගියා.

### කිරි මධ්‍යස්ථානය

අපි ආයේ ම කිරි මධ්‍යස්ථානයට ආවා. අපිට මුලින් ම හමුවුණු කෙසඟ ගැටයා සින්න රාජා කිරි භාජන ලැබෙනකන් ඉන්නවා. සින්න රාජාට බයිසිකලයක් ගත්තොත් ලේසියි නේද? වට පිට බලා සිය සගයන්ගෙන් මිදුන ඔහු කොහොමද බයිසිකල් ගන්නේ මම මෙතනින් ගන්න ගණනින් තමයි දහ දෙනෙක්ට කන්න දෙන්නේ. සහෝදරියෝ හත් දෙනෙක්. අම්ම තාත්ත. දවසකට කිරි කොච්චර දෙනවා ද? මම ගේන්නේ මගේ කිරිම නොවෙයි. මට හරක් නැහැ. කාගෙ හරි නැම්බියක් පුංචි



පාක්‍යරාජා කිරි දෙවයි

**පොළොන්නරුව සත්ව ගොවිපල ඉතා නවීන ක්‍රම යටතේ පැවතෙද්දී මනම්පිටිය තවම මඬේර යුගයේ වේතැයි පැවසීම වඩා නිවැරදිය. කිරි පට්ටි පාලන ව්‍යප්ති සේවා ගැන ඔවුන් අසා නැති තරම්ය.**

කාලෙම අරන් මම හදනවා මුල් පැටියාගේ කිරි මට. ඊට පස්සේ එළදෙනයි පැටියයි අයිතිකාරයට දෙන්න ඕන. ආයේමත් කාගේ හරි පැටියෙක් අරන් හදන්න ඕනි. තවත් කීප දෙනෙක් ගේ එළදෙනුන්ගෙන් කිරි දෙවලා ඒකත් මේතෙන්ට ගෙනත් දෙනවා. ඔහොම ලැබෙන එකෙන් තමයි අපි දහ දෙනා යන්තම් රැකෙන්නේ. සුළු ගණනක් හරි ඉතුරු කර ගන්න බලන්න ඕන නේද? සින්නරාජා හිස් අහස දෙස බලා කළ දෙක අතට ගත්තා

මනම්පිටිය කිරි වලට අතීතයේ ඉඳල ම ප්‍රසිද්ධ වුනත් කිරි පට්ටි පාලනය කියන දෙය එහි ජනතාව නොදන්නවාය කීම සත්‍යයක් පරම්පරාගත පවුලේ ගෞරවය රැක ගැනීමට හරක් පට්ටි තියාගෙන සිටින කීප දෙනා ඇරුනම අන් සියල්ලන් ම සින්නරාජා වගේ යන්තම් ජීවිතය ගැට ගහ ගන්න දැඩි සටනක යෙදෙන අයයි. හරක් ඉන්න අය උදේට කිරි දෙවන් හරක් කැලේට විල්ලුවලට අරිනවා. හැන්දෑවට දක්කන් ඇවිත් ගාල් කරනවා. උදේට දෙවන් ආයේ කැලේට අරිනවා. තමන්ට හරක් නැති අය සමහර හරක් අයිතිකරුවන්ගේ හරක් මේ අයුරින් ම බලා ගෙන කිරි දෙවලා කීයක් හරි ගන්නවා. මනම්පිටියේ කිරි පට්ටි පාලනයේ වත්මන් තත්වය ඔය වාක්‍ය තුනෙන් කැටිකර දක්වන්න පුළුවන්.

### තණ බිම්

ස්ථිර තණ බිම් වෙන් කර දීම මනම්පිටියේ මූලිකම අවශ්‍යතාවය යි. එහි ජනතාවට වෙනත් සත්ව ආහාරමිලට ගැනීමේ ආර්ථික හැකියාවක් නොමැති හෙයින් අඩු තරමේ තණ බිම් වත් දිය යුතුව ඇත. සතුන් වර්ග කර, පශු වෛද්‍ය සේවා පහසුකම් හා කිරි පට්ටි පාලනය පිළිබඳ මනා අවබෝධයක් ඔවුනට ලබා දීමත් අත්‍යාවශ්‍යය. සැතපුම් අටකට එහා පොළොන්නරුවේ රජයේ සත්ව ගොවිපල ඉතා නවීන කිරි පට්ටි පාලන ක්‍රම යටතේ කිරි පට්ටි තබාගෙන සිටිද්දී මනම්පිටි ජනතාව මේ අයුරින් පැවතීම මෙහි දුක්මුසු තාවය තවත් වැඩි කරවන්නකි. පොළොන්නරුව ගොවිපල ඉතා නවීන ක්‍රම යටතේ පැවතෙද්දී මනම්පිටිය තවම එඬේර යුගයේ වෙතැයි පැවසීම නිවැරදි ය.

තමන්කඩුව උකු කිරි කම්හලට කිරි එකතු කරන කිරි මණ්ඩල මධ්‍යස්ථාන දහතකින් මනම්පිටිය හතරවන තැන ගෙන ඇත. පෙබර වාරි මස මණ්ඩලය මනම්පිටියට තැබූ ඉලක්කය දිනක ලීටර 1,600 කි. මනම්පිටිය ලීටර 1,575 ක් සපයා ඇත. මාසය තුළ ලීටර 44,096 ක්. මෙය මනම්පිටිය කිරි පට්ටි සංවර්ධනයට ඇති හැකියාව විදහා දක්වන කදිම සාධකයකි. කිරි මණ්ඩලය කෙළින් ම නිෂ්පාදකයන් ගෙන් හෝ කිරි නිෂ්පාදකයන් පමණක් ඇතුළත් සමුපකාර සමිතියක් මගින් කිරි මිළට ගැනීමට කටයුතු කරන්නේ නම් දැනටත් වඩා තමන්ට ප්‍රයෝජන ලැබෙන බව මනම්පිටිය වාසීන් වැඩි දෙනෙකුගේ අදහස යි.

මනම්පිටිය වැනි ගම් බහුලව ඇති තමන්කඩුව ප්‍රදේශයේ ජනතාව කිරි නිපදවීමේ මෙතෙක් රඳවා ගැනීමට එකම ආධාරකය කිරි මණ්ඩලය බව ඔවුහු එක එල්ලේ ම පවසති. කිරි පට්ටි පාලනය විද්‍යානුකූලව කිරීමට රජය වෙනුවෙන් අනෙක් ආයතන සලසන සේවාවන් ගැන කී විට සාවඥව ඇහුම් කන් දීම කිරි මණ්ඩලය කෙරෙහි ඔවුන් තබා ඇති බලාපොරොත්තුව මැනවින් පෙන්වීමකි. එහෙයින් මෙම පෙදෙස්වල ජනතාවට අවශ්‍යව ඇති කිරි පට්ටි සංවිධානය පිළිබඳ විද්‍යානුකූල දැනුම ලබා දීමට කිරි මණ්ඩලය විසින් කටයුතු යෙදීම වඩාත් වැඩදයක වනු නිසැක ය.

---



# මම කිරි බොන්නේ නැහැ!

මේ ඉන්නේ මනම්පිටියේ පාක්‍යරාජා. එයා තමන්ගේ කිරි පට්ටියෙන් දවසකට කිරි ලීටර 30 ක් දෙවනවා. ඒත් කිරි බොන්නේ නැහැ; "මම උදේ හවස ලක්ස්ප්‍රේ බොනවා. ගෙදරින් කිරි බොන්නේ 'අප්පා' විතරයි. අනික් අය හැමෝම බොන්නේ ලක්ස්ප්‍රේ." එයා කියනවා.

ඒ එයාලාගේ පුරුද්ද. විවිධ පුද්ගලයන්ගේ විවිධ ආහාර රුචි අරුචිකම් තියෙනවා. රට රටවලත් එහෙමයි. සමහර රටවල කිරිවලට සම්බන්ධ අමුතු සිරිත් විරිත් තියෙනවා. අප්‍රිකාවේ ඇතැම් ගෝත්‍ර ජාතිකයන් සමහර කාලවලට කිරි බීමෙන් පමණක්,දිවි ගෙවනවා. මේ ගෝත්‍රිකයන් කිරි කඳුලක්වත් අපතේ යැවීම අසුබ ලකුණක් හැටියට සළකනවා.

කෙන්යාවේ නිලෝ ජාතික ගැබිණි මව්වරුන්ට දෙන්නේ ඒ සඳහාම වෙන් කළ එළදෙනෙකුගෙන් ගත් කිරියි. සෝමාලියානු මව්වරුන් තම කිරි තමන්ගේ කිරිසප්පයන්ට හොඳ මදියි හිතනවා. එරට ළදරුවන් 90% කටම දෙන්නේ එළ, එළු හෝ ඔටු කිරියි.

සයිරේ රාජ්‍යයේ සමහර ගෝත්‍රිකයන් ළදරුවන්ට මව් කිරි මිස වෙන කිරක් දීම රුස්සන්නේ නැහැ. දකුණු අප්‍රිකාවේ සුළු ගෝත්‍රිකයන් අතර පුදුම චාරිත්‍රයක්. ගෘහ මූලිකයෙකුගේ කිරි පට්ටියකින් ගන්නා කිරි බොන්න පුළුවන් එයාගේ නෑදෑයින්ට විතරයි. තමන්ට නෑදෑකමක් නැති පවුලකට අයිති කිරි එයාලට බොන්න බැහැ. මේනිසා කිරි වැඩිපුර තිබුණත් කරන්න දෙයක් නැහැ. ගෝත්‍රයේ කිසිවෙකුටවත් සම්බන්ධයක් නැති අයගේ කිරි බීමට කිසිම තහංචියක් නැහැ. පසුකලක මේ පෙදෙස්වල කිරිපිටි අලෙවිය ඉහළ ගියා. තවත් සමහර ගෝත්‍රිකයන් ගැහැණු දරුවන් වැඩිවියට පත්වීමෙන් පසු ඔවුනට කිරි බීම තහනම් කෙරෙනවා.